**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

**University of Sri Jayewardenepura**

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**

**External Degrees and Extension Courses Unit**

---

# විශේෂ නිවේදනයයි

## 2015 අධ්‍යයන වර්ෂය සඳහා විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාවට (නව නිර්දේශය) ලියාපදිංචි වූ සිසුන්ගේ ලියාපදිංචි කාලය අවසන් කිරීම

2015 අධ්‍යයන වර්ෂයට විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සඳහා පළමු ලියාපදිංචිය වසර 03 ක කාලයක් දක්වා වලංගු වන අතර ඉතිරි වසර 04 ක කාලය සඳහා ලියාපදිංචිය දීර්ඝ කිරීම සිදු කල යුතු වේ. ඒ අනුව මුළු අධ්‍යයන වර්ෂ කාලය අධ්‍යයන වර්ෂ 07 කි. 2015 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ගේ ප්‍රථම ලියාපදිංචි වලංගු කාල සීමාව 2016/05/01 දින සිට 2019/04/30 දිනෙන් අවසන් විය. ඉතිරි වසර 04 ක් සඳහා වන ලියාපදිංචිය දීර්ඝ කිරීමට අදාල වලංගු කාල සීමාව 2019/05/01 සිට 2023/04/30 දිනෙන් අවසන් වේ. පරීක්ෂණ සහ ලියාපදිංචි කිරීම් සම්බන්ධව නීති රීතිවලට අනුව මෙම වසර 7 ක කාලසීමාව තුල උපාධි I පරීක්ෂණ 07 ක්, උපාධි II පරීක්ෂණ 06 ක් සහ උපාධි III පරීක්ෂණ 05 ක් පැවැත්විය යුතු වේ.

**2015 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ට පහත පරිදි පරීක්ෂණ පවත්වා ඇත**

| | ලියාපදිංචි කාලය | පවත්වා ඇති පරීක්ෂණ ගණන | | |
|---|---|---|---|---|
| | | උපාධි I | උපාධි II | උපාධි III |
| ප්‍රථම ලියාපදිංචිය (වසර 03) | 2016.05.01 - 2019.04.30 | 02 | 02 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (පළමුවර) | 2019.05.01 - 2020.04.30 | 01 | 01 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (දෙවනවර) | 2020.05.01 - 2021.04.30 | 01 | 01 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (තෙවනවර) | 2021.05.01 - 2022.04.30 | 01 | 01 | 01 |
| ලියාපදිංචිය දීර්ඝ කිරීම (සිව්වනවර) | 2022.05.01 – 2023.04.30 | - | - | - |
| | | **05** | **05** | **04** |

මේ වන විට 2015 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ට ඉහත වගුවෙහි දක්වා ඇති පරිදි උපාධි I පරීක්ෂණ 05 ක්, උපාධි II පරීක්ෂණ 05 ක් සහ උපාධි III පරීක්ෂණ 04 ක් පවත්වා අවසන් ය. ඒ අනුව 2015 අධ්‍යයන වර්ෂයට ලියාපදිංචි වූ සිසුන්ට උපාධි I පරීක්ෂණ 02 ක්, උපාධි II පරීක්ෂණ 01 ක් සහ උපාධි III පරීක්ෂණ 01 ක් බැගින් ඉදිරියේදී පවත්වනු ලැබේ.

1. 2023 වර්ෂයට අදාල උපාධි I පරීක්ෂණය 2023 ජූලි මස පැවැත්වීමට නියමිතය. උපාධි I පරීක්ෂණය සඳහා 2023 ජූනි 15 දින දක්වා www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවිය හරහා අයදුම් කළ හැකිය. 2023 වර්ෂයේ උපාධි I පරීක්ෂණය පැවැත්වීමෙන් පසු **2015 අධ්‍යයන වර්ෂයට අදාල සිසුන්ට උපාධි I පරීක්ෂණයට පෙනී සිටීමට අවසාන වශයෙන් එක් අවස්ථාවක් පමණක් හිමි වේ .**

2. උපාධි II සහ III පරීක්ෂණ සඳහා 2023 අගෝස්තු/සැප්තැම්බර් කාලසීමාව තුලදී අයදුම්පත් කැඳවන අතර එම අයදුම්පත් www.external.sjp.ac.lk යන අපගේ වෙබ් අඩවියට පිවිස ලබා ගත හැක. **2015 අධ්‍යයන වර්ෂයට අදාල සිසුන්ට උපාධි II සහ III පරීක්ෂණ සඳහා පෙනී සිටීමට ඇති අවසාන අවස්ථාව මෙය වේ.**

3. සිව්වන වරට ලියාපදිංචිය දීර්ඝ කර ඇත්නම් නැවත ලියාපදිංචි අලුත් කිරීමේ ගාස්තු ගෙවීම අවශ්‍ය නොවේ.

ඉහත නිර්ණායක අනුව උපාධි I කොටස සඳහා පරීක්ෂණ 07 ක්, උපාධි II කොටස සඳහා පරීක්ෂණ 06 ක් සහ උපාධි III කොටස සඳහා පරීක්ෂණ 05 ක් පවත්වා අවසන් වූ පසු කිසිදු පරීක්ෂණයක් සඳහා පෙනී සිටීමට 2015 අධ්‍යයන වර්ෂයේ ලියාපදිංචි වූ කිසිදු සිසුවෙකුට අවස්ථාවක් නොමැති අතර ඉන් පසු 2015 අධ්‍යයන වර්ෂයට අදාල විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) සාමාන්‍ය (බාහිර) උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරිමට ලබාදුන් කාලය අවසන් වන බව කාරුණිකව දන්වා සිටිමි.

සහකාර ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2023/06/02